# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1868/60 - 2014 ජුනි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2014.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011.

### 1963 අංක 11 දරන මුදල් පනත

72 වන වගන්තිය යටතේ වූ නියමය

කලින් කල සංශෝධිත පරිදි 1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමග සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දාහතරක් වූ ජුනි මස 26 වන දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 ජුනි මස 26 වැනි දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

#### උපලේඛනය

1. සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ උතුරු උඩපත්තුවේ මිල්ලවිටියේ තිබෙන ''දියරතඹලේ හේන්යාය සහ පිටමුල්ල කුඹුර'' වී අමුණු දෙකක පමණ වපසරියට මායිම්, උතුරට දිග්ගෙඩිගහහේනද, නැගෙනහිරට ගම්පහේ කෝරාලලාගේ වත්තේ අගලද, දකුණට පැලිකඩමුල්ලේ ඕවිට ද, කුණ්ඩ මනන්නලාගේ ඕවිට ද, ගම්පහේ කෝරාලලාගේ පිටමුල්ල සහ හිරිකුඹුර ද, බස්නාහිරට මිල්ලවිටිය ගම් ඉමද යන මායිම් තුළ ඉඩමෙන් නොබෙදූ හැටහතරෙන් එකොලොස් පංගුව ද (11/64) සහ එහි තුළ රබර් පාලක කාර්යාලයේ අංක ජේ/158 ඇස් 1 ආර් 86 යටතේ ලියාපදිංචි කර තිබෙන රබර් වගාව ද වේ.

   මෙම ඉඩම රත්නපුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක ඒ 713/180 වන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

2. බලයලත් මිනින්දෝරු ඩී. ජී. මෙන්ඩිස් මහතා විසින් වර්ෂ 1992 ක් වූ ඔක්තෝබර් මස 03 වන දින සකස් කරන ලද අංක 3494 දරන පිඹුරේ නිරූපිත දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිට කෝරලේ වැලිතරට අයිති පාතෙගම්ගොඩ පිහිටි විදානෙ වලව්වේ වත්තේ අංක ඒ 1 දරන කැබැල්ලෙන් බෙදා වෙන් කල අංක ඒ දරන කැබැල්ල නම් වූ උතුරට දිනේස් ද සොයිසා මුහම්දිරම්ට අයිති අම්පිටියේ වත්තද, නැගෙනහිරට මෙම ඉඩමේ අංක බී දරන කැබැල්ල ද, දකුණට මෙම ඉඩමේ අංක ඒ 7 දරන කැබැල්ල සහ මෙම ඉඩමේ අංක ඒ 2 දරන කැබැල්ල ද, බස්නාහිරට මහදැලත්ගෙදර වත්ත ද යන ලෙස මායිම් තුළ පිහිටි රූඩ් එක (අක්. 0 රූඩ්. 1 පර්. 0) ක් විශාල ඉඩමේ සම්පූර්ණ බිම සහ ඒ තුල පිහිටි ගහ කොළ, පලතුරු සහ කුරුඳු වගාව ද වේ.

   මෙම ඉඩම බලපිටිය ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක බී 363/202 වන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

07 - 649


1A - PG 2096 — 100 (2014/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*